ස.සේ.කො. චක්‍රලේඛ අංක 01/2024

මගේ අංකය : ස.සේ.කො. 06/ චක්‍රලේඛ
සමුපකාර සේවක කොමිෂන් සභාව(වයඹ)
නව පළාත් සභා ගොඩනැගිල්ල,
දෙවන මහල, කුරුණෑගල

2024.03.06

වයඹ පළාතේ සියලුම සමුපකාර සමිති,
සංගම් හා මණ්ඩලවල,
ගරු සභාපති/ සාමාන්‍යාධිකාරී/ කළමනාකරු.

**සමුපකාර සමිති සේවකයින් සඳහා මාසික දීමනාවක් ලබා දීම.**

උක්ත කරුණ සම්බන්ධයෙන් සමුපකාර සමිති විසින් මෙම කොමිෂන් සභාවෙන් කරන ලද ඉල්ලීම් සලකා බලා වයඹ පළාතේ සමුපකාර සමිතියකට/ සංගමයකට/ මණ්ඩලයකට දීමනා ගෙවීමට මූල්‍ය හැකියාව ඇති බවට සමිතියේ / සංගමයේ/ මණ්ඩලයේ අධ්‍යක්ෂ මණ්ඩලය/ කාරක සභාව විසින් තීරණය කරන්නේ නම් සමුපකාර සේවකයින් වෙනුවෙන් පහත සඳහන් සීමාවන්ට යටත්ව මාසික දීමනාවක් ගෙවිය හැකි බව 2024.03.05 දිනැති කොමිෂන් සභාව නියම කර ඇත.

| සමිති වර්ගය | දීමනා හිමිකම් ලැබීමට අදාළ වන ප්‍රමිත වැටුප් වියදම් ප්‍රතිශතය | සමිති ශ්‍රේණිය | ගෙවිය හැකි උපරිම මාසික දීමනාව (රුපියල්) |
|---|---|---|---|
| විවිධ සේවා / සේවා /නිෂ්පාදන සමුපකාර සමිති, සංගම්, මණ්ඩල | 60% | A හා B ශ්‍රේණි | 7,000.00 |
| | | C හා D ශ්‍රේණි | 5,000.00 |
| ස.ණ.ස. සමිති හා මූල්‍ය සේවා සමුපකාර සමිති, සංගම් | 30% | A හා B ශ්‍රේණි | 7,000.00 |
| | | C හා D ශ්‍රේණි | 5,000.00 |

02. පවත්නා පිරිවැය තත්ත්වයන් හා වැටුප් වියදම් අනුව ඉහත අනුපාතය කාලීනව සමුපකාර සංවර්ධන කොමසාරිස් /රෙජිස්ට්‍රාර් (වයඹ) විසින් සංශෝධනය කරනු ලබන බැවින්, මේ සඳහා තත්කාලයේ වලංගු ප්‍රමිතිය අදාළ කර ගත යුතු වේ.

03. <u>මාසික වැටුප් වියදම් ප්‍රතිශතය ගණනය කිරීම හා හිමිකම් ලබන දීමනාව තීරණය කිරීම.</u>

මාසික වැටුප් වියදම් ප්‍රතිශතය පහත පරිදි ගණනය කළ යුතුය

$$\text{මාසික වැටුප් වියදම් ප්‍රතිශතය} = \frac{\text{අනුමත සියලු දීමනා සහිත මාසික වැටුප් එකතුව ( ප්‍රවර්තන මස)} \times 100}{\text{දළ ආදායම/ දළ ලාභය/ ශුද්ධ පොලී ආදායම (පෙර මස)}}$$

(අනුමත සියලු දීමනා සහිත මාසික වැටුප් එකතුව ලෙස සැලකිය යුත්තේ සමුපකාර සේවකයින්ගේ ඒකාබද්ධ වැටුප, අනුමත සියලු දීමනා, සේවක අර්ථ සාධක හා භාරකාර අරමුදල් දායකය, සමුපකාර සේවක විශ්‍රාම වැටුප් දායකය සහ යෝජිත දීමනා වටිනාකම් එකතුවයි)

04. මාසික වැටුප් වියදම් ප්‍රතිශතය 30% හෝ 60% සීමාව ඉක්මවන සමිති සඳහා ඇමුණුම 01 පරිදි දීමනා ගණනය කර ගෙවීමට හැකියාව ඇත.

05. මෙම දීමනාව 2024 වර්ෂයේ ජනවාරි මස සිට ගෙවිය හැකිය.

06. මෙම දීමනාව සමුපකාර සේවක විශ්‍රාම වැටුප් සඳහා දායක මුදල ගෙවීමේ දී හෝ විශ්‍රාම වැටුප් ගණනය කිරීමේ දී අදාළ නොවේ.

07. මෙම චක්‍රලේඛය වයඹ පළාත් සමුපකාර කොමසාරිස්/ රෙජිස්ට්‍රාර්ගේ එකඟතාව ඇතිව නිකුත් කරන ලදී.

කොමිෂන් සභා නියමය පරිදි,

එච්.එම්.පී.කේ. හේරත්
ලේකම්,
සමුපකාර සේවක කොමිෂන් සභාව.

පිටපත්,

01. ප්‍රධාන ලේකම්, වයඹ පළාත - කා.දැ.පි.

02. ලේකම්, සමුපකාර සංවර්ධන, වෙළඳ, ඉඩම්, විදුලි බල හා බලශක්ති, ක්‍රීඩා හා යෞවන කටයුතු සංස්කෘතික, කලා කටයුතු සහ තොරතුරු තාක්ෂණ අමාත්‍යාංශය - කා. දැ.පි.

03. සමුපකාර සංවර්ධන කොමසාරිස්/ රෙජිස්ට්‍රාර්, වයඹ පළාත - දැ.ගැ.පි. හා අ.ක.ස.

04. සියලුම සමුපකාර සේවක කොමිෂන් සභා ලේකම්වරු - දැ.ගැ.පි. හා අ.ක.ස.

05. සමුපකාර සංවර්ධන සහකාර කොමසාරිස් (කුරුණෑගල/ හලාවත/ කුලියාපිටිය/ මහව) - දැ.ගැ.පි. හා අ.ක.ස.

ඇමුණුම 01

**මාසික වැටුප් වියදම් ප්‍රතිශතය ඒ ඒ සමිති වර්ගයට අදාළ වන පරිදි ප්‍රමිති මට්ටම (30% හෝ 60%) ඉක්මවන සමිති සඳහා දීමනා ගණනය කරන ආකාරය.**

---

**යෝජිත දීමනාව සහිතව මාසික වැටුප් වියදම් ප්‍රතිශතය (I) ගණනය කිරීම**

මාසික වැටුප් වියදම් ප්‍රතිශතය (I) (යෝජිත දීමනාව සහිතව) = (අනුමත සියලු දීමනා සහිත මාසික වැටුප් එකතුව (යෝජිත දීමනාව සහිතව ප්‍රවර්තන මස) / දළ ආදායම/ දළ ලාභය/ ශුද්ධ පොලී ආදායම (පෙර මස)) X 100

**යෝජිත දීමනා හැර මාසික වැටුප් වියදම් ප්‍රතිශතය (II) ගණනය කිරීම**

මාසික වැටුප් වියදම් ප්‍රතිශතය (II) (යෝජිත දීමනාව හැර) = (අනුමත සියලු දීමනා සහිත මාසික වැටුප් එකතුව (යෝජිත දීමනාව හැර ප්‍රවර්තන මස) / දළ ආදායම/ දළ ලාභය/ ශුද්ධ පොලී ආදායම (පෙර මස)) X 100

**ප්‍රමිත වැටුප් වියදම් ප්‍රතිශතයන්ගේ වෙනස (III) ගණනය කිරීම.**

ප්‍රමිත වැටුප් වියදම් ප්‍රතිශතයන්ගේ වෙනස (III) = (ප්‍රමිතියේ ප්‍රතිශත අගය (30% හෝ 60%)) - (යෝජිත දීමනාව හැර මාසික වැටුප් වියදම් ප්‍රතිශතය (II))

**වැටුප් වියදම් ප්‍රතිශතයන්ගේ වෙනස ගණනය (IV) කිරීම.**

වැටුප් වියදම් ප්‍රතිශතයන්ගේ වෙනස (IV) = (යෝජිත දීමනාව සහිත මාසික වැටුප් වියදම් ප්‍රතිශතය (I)) - (යෝජිත දීමනාව හැර මාසික වැටුප් වියදම් ප්‍රතිශතය (II))

**ගෙවිය හැකි දීමනාවේ මාසික එකතුව (V) ගණනය කිරීම.**

ගෙවිය හැකි මාසික දීමනාවේ එකතුව (V) = (යෝජිත දීමනා වටිනාකමේ මුළු එකතුව* / වැටුප් වියදම් ප්‍රතිශතයන්ගේ වෙනස (IV)) X (ප්‍රමිත වැටුප් වියදම් ප්‍රතිශතයන්ගේ වෙනස (III))

*යෝජිත දීමනා වටිනාකමේ මුළු එකතුව = රු. 7000/- හෝ රු. 5000/- වටිනාකම x දීමනාව ගෙවනු ලබන මුළු සේවක සංඛ්‍යාව

**එක් අයකුට හිමි දීමනාව ගණනය කිරීම.**

එක් අයෙකුට හිමි දීමනාව = ගෙවිය හැකි මාසික දීමනාවේ එකතුව (V) / දීමනා ගෙවන සේවක සංඛ්‍යාව